# කාර්ය සාධන වාර්තාව
# 2007

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## <u>දැක්ම</u>

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා වන බහු ප්‍රවාහන මාධ්‍ය පරිසරයක් තුළ මූල්‍ය ස්වාධීනත්වයෙන් යුත් ගුණාත්මක දුම්රිය සේවාවක් සැපයීම.

## <u>මෙහෙවර</u>

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා
ආරක්ෂිත, විශ්වාසදායී, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සපයමු.

# අරමුණු

01. දුම්රිය ගමන් කාලය අඩු කිරීම හා කාලානුරූප ධාවනය වීමේ විශ්වාසනීයත්වය තහවුරු කිරීම.

02. යල් පැන ගිය සංඥා හා විදුලි සංදේශ පද්ධතිය සතුටුදායක මට්ටමකින් පවත්වා ගැනීම.

03. කාල සටහන් අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා දෛනිකව සැපයෙන එන්ජින් සංඛ්‍යාව 70% -75% අතර මට්ටමක රඳවා ගැනීම.

04. දුම්රියන් තුළ හා දුම්රිය ස්ථාන වල මඟීන් සඳහා සැපයෙන පහසුකම් සතුටුදායක මට්ටමකට ගෙන ඒම.

05. දුම්රිය ආදායම වැඩි කර ගැනීම.

06. දුම්රිය භාණ්ඩ ප්‍රවාහන සේවා සමාලෝචනය.

07. දුම්රිය මානව සම්පත් සංවර්ධනය සඳහා මූලික පියවර ගැනීම.

08. සංවිධාන ව්‍යුහයට සංශෝධන හා ක්‍රමවේදයන් කාලානුරූපව හඳුන්වා දීම.



# කාර්ය සාධනය 2007

2007 වසර ශ්‍රී ලංකා දුම්රිය සේවය ඵලදායි පදනමක් මත කාර්යශීලි පොදු ප්‍රවාහන සැපයුම් කරුවකුගේ මට්ටමට ගෙන යෑමේ දිගු ගමනක පදනම දැමීම අපේක්ෂා කරන ලදී.

දශක ගණනාවක් තුළ දිගින් දිගටම දුම්රිය සඳහා කරන ලද ආයෝජන තුලින් අපේක්ෂිත ඵලදායිතාවය නොලැබීම නිසා නොකඩවා සිදුවූ වත්කම්වල පිරිහීම, මානව සම්පත් බිඳ වැටීම වලක්වා ගැනීමට සුදුසු පියවර ගැනීම සඳහා තෝරා ගත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාවට නැංවීමේ අභිප්‍රායෙන් 2007 ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කරන ලදී.

වාර්ෂික ආයෝජන වල ප්‍රශස්ත නිමැවුමක් ලබා ගැනීම සඳහා නොතිබූ පසු විපරම් (Monitoring) ව්‍යුහයක් මෙවර ස්ථාපිත කිරීම මගින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අපේක්ෂා කරන ලදී.

ගණකාධිකාරී උප දෙපාර්තමේන්තුව හා අනෙකුත් සියළු උප දෙපාර්තමේන්තු හා සැළසුම් අංශය සක්‍රීය දායකත්වය ලබා ගැනීම මගින් මෙම පසු විපරම් ව්‍යුහය ස්ථාපිත කරන ලදී.

වැය ශීර්ෂ මත පදනම් වූ වියදම් කිරීමේ ක්‍රම වේදය වෙනුවට නිමැවුම ඉලක්ක කර ගත් මූල්‍යකරණ ක්‍රමවේදයක් නව යෝජනා මගින් අවධාරණය කෙරුණි.

උදාහරණයක් වශයෙන් කාලය පදනම් (පැය) සිදු කළ ගෙවුම් ක්‍රමවේදය ක්‍රමානුකූලව ඵලදායකත්වය මත ගෙවීමේ ක්‍රමවේදයකට පරිවර්ථනය කිරීමේ ක්‍රියාවලියට මූලික පදනම දැමීමට අවශ්‍ය ව්‍යුහය සකස් කර ඇත. මෙම අභ්‍යන්තර රාමුව පිහිටුවා දුම්රිය සේවය කාර්යශීලී බවට පත් කිරීමේ සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් (Transition) ආරම්භ කිරීම මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සමග ආරම්භ විය.

## පුනරාවර්තන වැය ශීර්ෂ

- පුනරාවර්තන වියදම් ශිර්ෂ මගින් 'සේවාවේ' කාර්යක්ෂමතාවයේ ප්‍රගතිය වැඩි කිරීම ඉලක්ක කර ඇත. දෙපාර්තමේන්තුව සතු කාර්ය මණ්ඩල යොදවා ගැනීමේදී සේවාවේ කාර්යක්ෂමතාවය හැකිතාක් දුරට වැඩිකර ගැනීමේ නිර්නායකයට ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇත. මේ සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

- හඳුන්වා දෙනු ලබන නව ක්‍රමවේදයන් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් මෙම වැය ශීර්ෂ වල ඉතිරි කිරීම් සිදුකර ගැනීමට ප්‍රයත්නයක් දරණ ලදී. ඵලදායකත්වය ඉලක්ක කරන අතර වියදම් පාලනය කිරීම සඳහා වඩාත් සක්‍රීය ක්‍රියාමාර්ග ගනු ලැබීය.

- ඉන්ධන මෙන්ම ජල, විදුලි, දුරකථන ආදී සේවාවන් වාණිජ පදනමක් මත ලබා ගැනීමේදී දුම්රිය දෙපාර්තමේන්තුවට ආර්ථිකයේ සිදුවන බලපෑම් වලට මුහුණ දීමට සිදුවන අතර ප්‍රතිපාදන වෙන් කිරීමේදී මේ පිළිබඳ සැලකිලිමත් විය.

- නිල ඇඳුම්, සබන් ආදී පාරිභෝජන ද්‍රව්‍ය නියමිත අංශවලට ලබාදීමේදී මෙතෙක් පැවති ක්‍රමවේදයන්හි වෙනස්කම් සිදු කිරීම මගින් පරිපාලන පහසුව මෙන්ම උපරිම ප්‍රතිලාභ දෙපාර්තමේන්තුවට ලබා ගැනීම අපේක්ෂා කරන ලදී.

## පරිපාලන අංශයේ කාර්ය සාධනය

දුම්රිය දෙපාර්තමේන්තුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වත්මන් අවශ්‍යතාවයන්ට අනුකූලව කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය උපරිම කිරීමට යෝග්‍ය පරිදි ප්‍රතිසංවිධානය කිරීම.

ප්‍රධාන විධායක නිලධාරි වන දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මූලික කාර්යභාරය වන දුම්රිය සේවාවේ ප්‍රගමනය සඳහා කාලය හා අවධානය වැඩි වශයෙන් යොමු කිරීමට සැලසීමෙන් මහජන සම්බන්ධතා හා රජයේ සහ අනෙකුත් ආයතන සමග පැවතිය යුතු සම්බන්ධතා සඳහා කාර්යක්ෂම හා ඉක්මන් ප්‍රතිචාර දැක්වීම.

## සේවක සංඛ්‍යාව

| | |
|---|---|
| 2007-01-01 දිනට සිටි සංඛ්‍යාව | 16650 |
| 2007-12-31 දිනට සිටි සංඛ්‍යාව | 16189 |

## බඳවා ගැනීම්

| ශ්‍රේණිය/ තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ඉංජිනේරු සේවය ii/ii | 06 |
| දුම්රිය එංජින් රියදුරු | 11 |
| දුම්රිය නියාමක | 21 |
| දුම්රිය නියාමක (අභ්‍යන්තර) | 32 |
| සැලසුම් ශිල්පීන් | 07 |
| තාවකාලික | 78 |
| තාක්ෂණික ශිල්පි සහායක/කම්කරු iii | 1217 |

## උසස්වීම්

| තනතුරෙන් | තනතුරට | සංඛ්‍යාව |
|---|---|---|
| දු.ස්ථා II පෙළ | දු. ස්ථා I පෙළ | 07 |
| දුම්. රියදුරු II ආ | දුම්. රියදුරු I පෙළ | 19 |
| දුම්. නියාමක (ශ්‍රීලංකාසේ) | දුම්. නියාමක විශේෂ පංතිය | 48 |
| දු.නි. | දුම්. නියාමක II ආ | 06 |
| දු. කා. සා. | ලාම්පුකරු | 03 |
| දු. කා. සා. | පොලිස්මන්/පොයින්ට්ස්මන් | 67 |
| පොයින්ට්ස්මන් | සංඥාකරු | 04 |
| ෂන්ටර් | යාර්ඩ් පෝර්මන් | 05 |
| පොයින්ට්ස්මන් | ෂන්ටර් | 09 |
| යාඩ් පෝර්මන් | යාර්ඩ් මාස්ටර් | 02 |
| මූ.තා. සේවය | මූ.තා. සේවය II අ | 16 |
| ට්‍රැවසර් රියදුරු | ට්‍රැවසර් රියදුරු නව II | 01 |
| මූ.තා. සේවය | මූ.තා. සේවය II ආ | 05 |
| යන්ත්‍රශිල්පි | යන්ත්‍රශිල්පි නව II | 01 |
| ඩක්කුකරු | ඩක්කුකරු නව II | 03 |
| දොඹකර රියදුරු | දොඹකර රියදුරු නව II | 01 |
| කාර්මික ශිල්පි | කාර්මික ශිල්පි නව II | 01 |
| තා.ශි. සහායක | තා.ශි. සහායක II යාන්ත්‍රික | 41 |
| තා.ශි. සහායක | විශේෂ කම්කරු | 09 |
| තා.ශි. | තා.ශි. II අ කම්බිකරු | 06 |
| තා. ශි. | තා.ශි. II ආ කම්බිකරු | 07 |
| වැද්දුම්කරු I | උපදේශක අභ්‍යාසලාභී | 02 |
| මැනුම් සහායක II | මැනුම් සහායක I ශ්‍රේණියට | 01 |
| III පෙළ කම්කරු | නව II ගබඩාකරු | 02 |
| III පෙළ කම්කරු | නව II වැද්දුම්කරු | 01 |

## විනය

2007-01-01 දින සිට 2007-12-31 දක්වා පැන නැගුණු විනය කරුණු සංඛ්‍යාව 252

2007-01-01 දින සිට 2007-12-31 කාලය තුළ අවසන් කළ විනය කරුණු සංඛ්‍යාව 207

## කම්කරු සබඳතා

2007-01-01 දින වන විට පැවති වෘත්තීය සමිති සංඛ්‍යාව 107 ක් වන අතර එය 2007-12-31 වන විට 112 දක්වා වර්ධනය වී ඇත.

උප දෙපාර්තමේන්තු සහ කාර්යාලීය මට්ටමෙන් සමාජ ආයතන සහ සුභසාධන සංගම් 60 ක් ලියාපදිංචි කර ඇත.

## මානව සම්පත් කළමනාකරණය

### ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය මගින් 2007 වසර සඳහා පවත් වනු ලැබූ පූර්ණ කාලීන පාඨමාලා පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පාඨමාලාව | බඳවාගනු ලැබූ සිසුන් සංඛ්‍යාව |
|---|---|
| මෝටර් යාන්ත්‍රික ශිල්පි. | 18 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පි. | 17 |
| විදුලි ශිල්පි. | 22 |
| පෑස්සුම්කරු. | 24 |
| යන්ත්‍රකරු. | 17 |

2007 වසර තුළ පාඨමාලා නිම කළ සිසුන් සංඛ්‍යාව (පූර්ණකාලීන)

| පාඨමාලාව | කණ්ඩායම | සංඛ්‍යාව |
|---|---|---|
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පි. | 2004 | 21 |
| විදුලි ශිල්පි. | 2003 | 18 |
| පෑස්සුම්කරු. | 2003 | 12 |
| යන්ත්‍රකරු. | 2003 | 16 |

2007 වසර තුළ පූර්ණ කාලීන පාඨමාලා හැදෑරූ මුළු සිසුන් සංඛ්‍යාව 285 ක් විය. කෙටිකාලීන පාඨමාලා හැදෑරූ මුළු සිසුන් සංඛ්‍යාව 536 ක් වූ අතර එයින් 44 දෙනෙක් බාහිර ආයතන වලින් පැමිණි සිසුන් විය. ඉන් 492 ක් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට අයත් වේ.

## අභ්‍යන්තර විගණන විමසුම්

පහත දැක්වෙන අංශයන් හි මෙම වසරෙහි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන ලදී.

| අනු අංකය | ස්ථානය | ප්‍රමාණය | විෂමතා හමුවූ ස්ථාන ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | දුම්රිය ස්ථාන | 143 | 5 |
| 2 | උප දුම්රිය ස්ථාන | 135 | 6 |
| 3 | දිස්ත්‍රික් විදුලි සංදේශ පරීක්ෂක කාර්යාල | 3 | |
| 4 | ධාවනාගාර | 8 | |
| 5 | ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල | 15 | |
| 6 | ගොඩනැගිලි පරීක්ෂක කාර්යාල | 13 | |
| 7 | කර්මාන්ත ශාලා | 2 | |
| 8 | ගිණුම් කාර්යාල | 7 | |
| 9 | පොදු කාර්යාල | 16 | |
| 10 | ගබඩා | 07 | |

### විගණකාධිපති ගේ විගණන විමසුම්

| අනු අංකය | විගණන විමසුම් | ප්‍රමාණය |
|---|---|---|
| 1 | 2006-12-31 දිනට පිළිතුරු සැපයීමට ඉතිරිව පැවති විමසුම්. | 19 |
| 2 | 2007 වර්ෂය තුළ ලැබුණු විගණන විමසුම්. | 65 |
| 3 | 2007 වර්ෂයේ නිමකිරීමට තිබූ විගණන විමසුම්. | 84 |
| 4 | 2007 වර්ෂයේ පිළිතුරු සැපයූ 2006 විගණන විමසුම්. | 19 |
| 5 | 2007 වර්ෂයේ පිළිතුරු සැපයූ 2007 විගණන විමසුම්. | 49 |
| 6 | 2007 වර්ෂයේ පිළිතුරු සැපයූ මුළු විගණන විමසුම් ගණන. | 68 |
| 7 | 2007-12-31 දිනට පිළිතුරු සැපයීමට ඉතිරිව පැවති විමසුම් ගණන. | 16 |

## මෙහෙයුම් අංශයේ කාර්ය සාධනය

### කාර්යභාරය

- කොළඹ තදාසන්න දුම්රිය සේවා.
- දුරස්ථ හා නගරාන්තර දුම්රිය සේවා.
- ප්‍රාදේශීය දුම්රිය සේවා.
- භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සේවා.

## කාලානුරූප ධාවනය-2007 වර්ෂය

| විස්තරය | අනුමත දුම්රිය සංඛ්‍යාව | ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව | නියමිත වේලාවට ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව | ප්‍රමාදවී ධාවනයවීම් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මිනිත්තු 06'-10' | 11'-30' | 31'-60' | 60 ට වැඩි |
| i. **මගී** | **116,008** | **108,369** | **37,993** | **11,559** | **36,082** | **14,008** | **8,726** |
| තදාසන්න | 69,795 | 65,200 | 29,225 | 7,382 | 21,917 | 5,571 | 1,105 |
| දුරස්ථ සහ නගරාන්තර | 19,941 | 19,878 | 2,951 | 1,824 | 5,807 | 4,732 | 4,564 |
| ප්‍රාදේශීය | 26,272 | 23,291 | 5,817 | 2,353 | 8,358 | 3,705 | 3,057 |
| ii. **භාණ්ඩ** | **7,514** | **6,036** | **623** | **87** | **355** | **540** | **4,431** |
| **එකතුව** | **123,522** | **114,405** | **38,616** | **11,646** | **36,437** | **14,548** | **131,157** |

2007 වසර තුළ ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව 114,405 ක් වූ අතර නියමිත වේලාවට ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව 38,616 ක් වේ. ප්‍රමාද වී ධාවනය වීම් 75,788 ක් වූ අතර එයින් මගී දුම්රිය 70,375 ක් සහ භාණ්ඩ දුම්රිය 5,413 ක් විය.

### කිලෝමීටර ප්‍රමාණය-2007 වසර

| විස්තරය | බලවේග කට්ටල ධාවනයවීම් | බලවේග කට්ටල අවලංගුවීම් | ඩීසල් දුම්රිය ධාවනයවීම් | ඩීසල් දුම්රිය අවලංගුවීම් | ධාවනයවීම් එකතුව | අවලංගුවීම් එකතුව |
|---|---|---|---|---|---|---|
| i. **මගී** | **2,756,662** | **77,321** | **6,054,329** | **195,162** | **8,810,991** | **272,483** |
| තදාසන්න | 2,703,799 | 61,822 | 1,026,095 | 72,301 | 3,729,894 | 134,123 |
| දුරස්ථ සහ නගරාන්තර | 0 | 0 | 3,418,947 | 14,225 | 3,418,947 | 14,225 |
| ප්‍රාදේශීය | 52,863 | 15,499 | 1,609,287 | 108,636 | 1,662,150 | 124,135 |
| ii. **භාණ්ඩ** | **0** | **0** | **371,759** | **90,709** | **371,759** | **90,709** |
| iii. **හිස් දුම්රිය** | **37,124** | **0** | **71,938** | **0** | **109,062** | **0** |
| iv. **සැහැල්ලු එංජින්** | **0** | **0** | **22,673** | **0** | **22,673** | **0** |
| **එකතුව** | **2,793,786** | **77,321** | **6,520,699** | **285,871** | **9,314,485** | **363,192** |

### විශේෂ දුම්රිය කිලෝ මීටර -2007 වසර

| විස්තරය | මගී/ බඩු සහිත ඩීසල් දුම්රිය | මගී/ බඩු රහිත ඩීසල් දුම්රිය | මගී/ බඩු සහිත වාෂ්ප දුම්රිය | මගී/ බඩු රහිත වාෂ්ප දුම්රිය | එකතුව |
|---|---|---|---|---|---|
| විශේෂ මගී දුම්රිය | 87,740 | 444 | 0 | 0 | **88,184** |
| විශේෂ බඩු දුම්රිය | 17,833 | 5,602 | 0 | 0 | **23,435** |
| සේවා දුම්රිය | 97,751 | 3,061 | 0 | 0 | **100,812** |
| හිතාචි | 32,671 | 7,208 | 0 | 0 | **39,879** |
| ඩීසල් ඩිලයුක්ස් | 1,030 | 1,013 | 0 | 0 | **2,043** |
| වයිස්රෝයි | 5,686 | 519 | 0 | 0 | **6,205** |
| බැලස්ට් | 4,897 | 1,550 | 0 | 0 | **6,447** |
| මෝටර් ට්‍රොලි | 7,930 | 1,445 | 0 | 0 | **9,375** |
| හුණුගල් | 63,831 | 45,179 | 0 | 0 | **109,010** |
| රේල් බස් | 19,941 | 3,400 | 0 | 0 | **23,341** |
| බ්‍රේක් ඩවුන් (ආපදා) | 2,308 | 552 | 0 | 0 | **2,860** |
| අත්හදා බැලීම් ධාවන | 30 | 0 | 0 | 0 | **30** |
| දොඹකර දුම්රිය | 65 | 65 | 0 | 0 | **130** |
| **එකතුව** | **341,713** | **70,038** | **0** | **0** | **411,751** |

### පීලි පැනීම් සහ දුම්රිය අනතුරු

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ධාවන මාර්ග තුළ | 62 |
| අංගන | 119 |

## එංජින්/ ගැල් සහ මැදිරි

### දුම්රිය එන්ජින්

මෙම වර්ෂයේ අවසන් වන විට දිනකට ධාවනය සඳහා අවශ්‍ය වන එන්ජින් සංඛ්‍යාව 63ක් වේ. එම එන්ජින් වලින් 50% ක්ම වසර 30 කට වඩා පැරණිය. එන්ජින් දෝෂ, අබලන් වීම, බිඳ වැටීම්, හේතු කොට ගෙන දිනකට දුම්රිය ධාවනය සඳහා ලැබෙනුයේ එන්ජින් 50 ක් පමණි. දැනට පවතින එන්ජින් හිඟයට පිළියමක් වශයෙන් කෙටිකාලීනව එන්ජින් අළුත්වැඩියා කිරීම/ප්‍රතිසංස්කරණය කිරීමත්, මධ්‍යකාලීනව එන්ජින් 10 ක් ගෙන්වීමටත් පියවර ගෙන ඇත.

### දුම්රිය මැදිරි

මෙම වර්ෂයේ අවසන් වන විට "මැදිරි 100 ක් ආනයනය කිරීමේ ව්‍යාපෘතිය" යටතේ චීනයෙන් ආනයනය කල මැදිරි ද ඇතුළුව භාවිතයට ගත හැකි මගී මැදිරි සංඛ්‍යාව 625ක් විය. එයින් ක්‍රියාකාරී මැදිරි ඇත්තේ 395 ක් පමණි. ඉහත සඳහන් කල මැදිරි වලින් 75% ක් ම අවු 25 ඉක්මවූ හෙයින් අවශ්‍ය මගී ඉල්ලුම සැපයිය නොහැකි වී ඇත. මේ හේතුව මත 2008 වර්ෂය අවසන් වන විට මගී මැදිරි ප්‍රතිසංස්කරණය කිරීමටත් හා බලවේග කට්ටල 15 චීනයෙන් ආනයනය කිරීමටත් බලාපොරොත්තු වෙයි.





(මැදිරි 100 චීනයෙන් ආනයනය කිරීම යටතේ මෙරටට ගෙන්වූ මැදිරි)



චීනයෙන් ගෙන්වීමට නියමිත බලවේග කට්ටල (S 10)

## ඇංජින් ගැල් හා මැදිරි නඩත්තු

| විස්තරය | ඉලක්කය | නිමකළ ප්‍රගතිය |
|---|---|---|
| **එංජින් සහ බලවේග කට්ටල අළුත්වැඩියාව** | | |
| උප ලේඛණ ගත අළුත්වැඩියාවන් | 46 | 38 |
| සැහැල්ලු අළුත්වැඩියාවන් | 400 | 48 |
| **මැදිරි අළුත්වැඩියාවන්** | | |
| උප ලේඛණ ගත අළුත්වැඩියාවන් | 265 | 214 |
| සැහැල්ලු අළුත්වැඩියාවන් | 59 | 52 |
| **ගැල් අළුත්වැඩියාවන්** | | |
| උප ලේඛණ ගත අළුත්වැඩියාවන් | 160 | 162 |
| සැහැල්ලු අළුත්වැඩියාවන් | 900 | 588 |

## ධාවන බල සැපයුම

**ඩිසල් ජලවිදුලි දුම්රිය එංජින්**

| විස්තරය | W1 | W2 | W3 | Y | S5 |
|---|---|---|---|---|---|
| නඩත්තුවේ පවත්නා ප්‍රමාණය | 2 | 2 | 10 | 24 | 3 |
| සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණය | 4 | 0 | 8 | 20 | 2 |
| සේවය සඳහා ලැබූ ප්‍රමාණය | 1 | 0 | 7 | 20 | 2 |

**ඩිසල් විදුලි එංජින්**

| විස්තරය | M2 | M4 | M5 | M5A | M5B | M5C | M6 | M7 | M8 | M8A | M9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නඩත්තුවේ පවත්නා ප්‍රමාණය | 13 | 14 | 0 | 0 | 4 | 4 | 14 | 15 | 8 | 2 | 10 |
| සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණය | 10 | 10 | 0 | 0 | 3 | 3 | 11 | 11 | 6 | 1 | 8 |
| සේවය සඳහා ලැබූ ප්‍රමාණය | 9 | 8 | 0 | 0 | 2 | 3 | 9 | 10 | 5 | 2 | 3 |

**බලවේග කට්ටල**

| විස්තරය | S3 | S6 | S7 | S8 | S9 |
|---|---|---|---|---|---|
| නඩත්තුවේ පවත්නා ප්‍රමාණය | 0 | 4 | 6 | 20 | 15 |
| සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණය | 0 | 2 | 4 | 17 | 13 |
| සේවය සඳහා ලැබූ ප්‍රමාණය | 0 | 2 | 3 | 15 | 13 |


**ධාවන බල කාර්ය සාධනය**

| **විස්තරය** | **ප්‍රමාණය** |
|---|---|
| එංජින් කි.මී. | 10,235,208 |
| මැදිරි කි.මී. | 67,239,927 |

# යටිතල පහසුකම්

## දුම්රිය මාර්ගය

දුම්රිය ධාවනය සඳහා ඇති මුළු මාර්ග කිලෝමීටර් 1,640 ක් වුවද වර්තමානයේ උතුරු මාර්ග යේත් නැගෙනහිර මාර්ගවල පවතින සිවිල් ත්‍රස්තවාදි කලබල හේතු කොට ගෙන කිලෝමීටර් 1,200 දැනට ධාවනය සඳහා යොදා ගෙන ඇත. එයින් 50% ක් නියමිත තත්වයට වඩා පහළ මට්ටමක පවතියි. ඒ අනුව 2007 වසර අවසන් වන විට වේග සීමා 812 ක් ඇති අතර එයින් අබලන් වූ සිල්පර හේතුවෙන් ඇති සීමාවන් ප්‍රමාණය 413 ක් වේ.




මෙම වේග සීමාවන් හේතු කොට ගෙන පැයට කිලෝමීටර් 41 සමාන්‍ය වේගයක් පවතියි. මෙම වේග සීමාවන් දුම්රිය ධාවනයේ ආරක්ෂාවට බාධාවකි. තවද සිල්පර හිඟය, රේල් පීලි හිඟකම, ගෙවී යාම හා අඩු බැලස්ට් ප්‍රමාණය මෙම තත්වය වැඩි කිරීමට හේතු වූ කරුණක් වේ.

**ප්‍රගතිය (භෞතික)**

| | |
|---|---|
| පීලි එලීම (කි.මී.) | 23 |
| කොන්ක්‍රීට් සිල්පර (කි.මී.) | 27 |
| දැව සිල්පර (කි.මී.) | 32 |
| බැලස්ට් කියුබ් | 26,909 |

ඉහත සංඛ්‍යා සටහනට අනුව දුම්රිය මාර්ගය නඩත්තු කටයුතු පුළුල් කිරීමටත්, ඌනතාවන් මගහරවා ගැනීමටත්, සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. ඒ අනුව ද්විත්ව මාර්ග කළුතර උතුර - පයාගල දකුණ දක්වාත්, ජා-ඇල - මීගමුව දක්වාත්, ඉදි කිරීමට බලාපොරොත්තු වේ. අඩු බැලස්ට් ප්‍රමාණයද කාර්යක්ෂම දුම්රිය සේවයට බාධාවකි. බැලස්ට් නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් අඹේපුස්ස ගල් කොරිය නිෂ්පාදනය වැඩි කිරීමටත්, ගල්ගමුව ගල් කොරිය ආරම්භ කිරීමටත් පියවර ගෙන ඇත.

දුම්රිය ධාවන කාලය අඩු කිරීමේ අරමුණින් දුම්රිය මාර්ග ද්විත්වකරණය යටතේ මෙම වසරේදී කැළණිය, ජා ඇල, සීදූව, කළුතර හා පින්වත්ත පාළම් ඉදි කරන ලදී.

## නඩත්තු වැඩ

| විස්තරය | පැයට කි.මී. 10 ට අඩු | පැයට කි.මී. 10 ට වැඩි |
|---|---|---|
| 2007 1-1 දින වන විට පැවති වේග සීමාවන් ප්‍රමාණය | 88 | 748 |
| 2007 වර්ෂය තුළ ඉවත් කල වේග සීමාවන් ප්‍රමාණය | 88 | 268 |
| 2007 වර්ෂය තුළ අලුතින් එක්වු වේග සීමාවන් ප්‍රමාණය | 86 | 267 |
| 2007-12-31 වන විට පැවති වේග සීමාවන් ප්‍රමාණය | 86 | 747 |

### මාර්ග නඩත්තුව සඳහා උපයෝගි කරගත් ද්‍රව්‍ය

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| රේල් පීලි (මීටර 20) | 1,737 |
| භාවිතාකල රේල් පීලි (අඩි 45) | 3,857 |
| දැව සිල්පර | 65,384 |
| කොන්ක්‍රීට් සිල්පර | 44,823 |
| වානේ සිල්පර | 3,000 |
| බැලස්ට් (කියුබ්) | 12,080 |
| සේවා දුම්රිය ප්‍රමාණය | 398 |

### පාළම්

කැළණිය, ජාඇල හා කළුතර පාළම් අළුතින් ඉදිකළ අතර පාළම් 07 ක් පුනරුත්ථාපනය කරන ලදී.




### ගොඩනැගිලි වැඩිදියුණු කිරීම්

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| දුම්රිය ස්ථාන | 41 |
| නිලධාරී නිල නිවාස | 56 |
| කර්මාන්ත ශාලා ගොඩනැගිලි | 22 |
| වෙනත් ගොඩනැගිලි | 64 |




### නව මාර්ග ඉදිකිරීම්

| විස්තරය | දුර කි.මී. |
|---|---|
| කළුතර උතුර - කළුතර දකුණ | 2 |
| ජා ඇල - සීදුව | 6 |
| ඔරුගොඩවත්ත - කැළණිය | 2.2 |

# සංඥා පද්ධතිය

2007 වසරේ දී සංඥා පද්ධතියේ පවතින දෝෂයන් අවම කර ගැනීමේ අරමුණින් කාර්යක්ෂම දුම්රිය සේවාවක් ලබා දීමටත් සංඥා පද්ධතිය නවීකරණය කිරීමටත් විවිධ පියවර ගෙන ඇත. 2006 වසර දී සංඥා දෝෂයන් 2219 ක් සහ 2007 වසර අවසන් වන විට 2132 ක් විය. හැකි තාක් දුරට සංඥා දෝෂයන් අවම කර කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවාවක් ස්ථාපිත කිරීමට සංඥා පද්ධතිය නවීකරණය කරනු ලබයි. මේ වර්ෂය තුළ දී දුම්රිය මාර්ග ජාලය හරහා ප්‍රකාශ තන්තු කේබලයක් සවි කිරීමට මධ්‍යකාලීනව සැලසුම් සකස් කරන ලදී. අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා නව සංඥා ක්‍රම හඳුන්වා දීම, විදුලි සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීමත් බලාපොරොත්තු වේ. මරදාන වාද්දුව අතර සංඥා පද්ධතියේ දුර්වලතා ඉවත්කර නව සංඥා පද්ධතියක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.




## වාණිජ සහ අලෙවි කාර්ය සාධනය

| විස්තරය | මූලික ඇස්තමේන්තු (රු.මි.) | සංශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | තත්‍ය ආදායම/වියදම (රු.මි.) |
|---|---|---|---|
| **ආදායම** | **2,327** | **3,652** | **2,999** |
| මගී ප්‍රවාහනය | 1,760 | 2,775 | 2,033 |
| පාර්සල් හා තැපැල් | 77 | 105 | 99 |
| භාණ්ඩ | 298 | 460 | 314 |
| විවිධ | 192 | 312 | 553 |
| **වියදම** | **21,400** | **21,400** | **13,353** |
| පුනරාවර්තන | 7,728 | 7,728 | 7,296 |
| ප්‍රාග්ධන | 13,672 | 13,672 | 6,057 |

සංශෝධිත ඇස්තමේන්තුව පිළියෙල කරනු ලැබුයේ මගී ගාස්තු සංශෝධනයක් 2007 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමේ උපකල්පනය මතය. එහෙත් මේ සඳහා අවශ්‍ය අනුමැතිය නොලැබීම හේතුවෙන් ඇස්තමේන්තු ගත ආදායම ලබා ගැනීමට නොහැකි විය.

| | |
|---|---|
| සාමාන්‍ය ප්‍රවේශපත් මගින් | 51,515,078 |
| වාර ප්‍රවේශපත් මගින් | 58,814,553 |
| මගී කිලෝමීටර | 4,766,853,786 |
| භාණ්ඩ ටොන් කි.මී. | 133,207,076 |

මෙම වර්ෂයේ 2007-02-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් වැඩිකර ගැනීමේ අරමුණින් පහත පියවරයන් ගන්නා ලදී.

- වාර ප්‍රවේශපත්‍ර හෝල්ඩර් සඳහා ගාස්තු වැඩි කිරීම.
- විශේෂ දුම්රිය සඳහා ආසන වෙන් කිරීමේ ගාස්තුව සංශෝධනය කිරීම.

- දඩ මුදලින් ප්‍රවේශ පත්‍ර පරීක්ෂක සෝදිසි කරුවන්ට ගෙවනු ලබන 50% කොමිස් මුදල 2007-02-01 දින සිට 10% කිරීම.
- සංචාරක බංගලා සඳහා අය කරන ගාස්තුව සංශෝධනය කිරීම.
- දෙපාර්තමේන්තු සේවකයෙකුගෙන් දිනකට අය කරන ගාස්තුව රු 1000 - 3000 දක්වා ද, වෙනත් පුද්ගලයින්ගේ ගාස්තුව රු 3000 - 6000 දක්වා ද වැඩි කරන ලදී.

2007 මුල් කාර්තුව අවසන් වන විට ප්‍රතිපත්තිමය රාමුවක් පිහිටුවන ලදී. ඒ මත ඉදිරි සැලසුම් හා ක්‍රියා මාර්ග වල පදනම සකස් කිරීමට කටයුතු කරන ලදී.

## භාණ්ඩ ප්‍රවාහනය (ටොන්)

| භාණ්ඩ වර්ගය | ටොන් |
|---|---|
| පිටි | 63,995 |
| ආනයනික ආහාර ද්‍රව්‍ය | 4,731 |
| ඛණිජතෙල් | 508,833 |
| සිමෙන්ති (නිමවූ) | 70,956 |
| සිමෙන්ති (අමුද්‍රව්‍ය) | 1,038,276 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 47 |
| පොහොර | 11,166 |
| යන්ත්‍රසූත්‍ර | 1,477 |
| අනෙකුත් භාණ්ඩ | 4,010 |
| **එකතුව** | **1,703,491** |



## ඉඩම් බදු දීම්

| | |
|---|---|
| ඉඩම් බදු දීම සඳහා විවෘතව ඇති සමස්ථ ස්ථිර ලිපිගොනු සංඛ්‍යාව | 7,248 |
| ගිවිසුම් සහිත ලිපි ගොනු සංඛ්‍යාව | 5,419 |
| ගිවිසුම් රහිත ලිපි ගොනු සංඛ්‍යාව | 1,829 |
| සක්‍රීය ඉඩම් බදු ලිපි ගොනු සංඛ්‍යාව | 125 |

බදු ලබා දී ඇති කාර්යයන් සම්බන්ධ ලිපිගොනු

| | |
|---|---|
| වගා කටයුතු සඳහා | 4,311 |
| වාණිජ කටයුතු සඳහා | 486 |
| නේවාසික අවශ්‍යතා වෙනුවෙන් | 186 |
| ජලනල එලීම වෙනුවෙන් | 206 |
| විදුලි රැහැන් සඳහා | 231 |
| දුරකථන රැහැන් සඳහා | 12 |
| වෙනත් | 1,821 |

| විස්තරය | ඉලක්කය | ලැබූ ආදායම | හේතු |
|---|---|---|---|
| ඉඩම් බදු ආදායම (රු.මි.) | 55 | 45 | දුම්රිය රක්ෂිත කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම සඳහා සංවිධානයක් නොවීම. මේ සඳහා දේපල කමිටුවක් පිහිටුවා දුම්රිය ඉඩම් ප්‍රතිපත්තියක් සකස්කර රජයේ අනුමැතිය ලබා ගැනීමටත් ඉඩම් අංශය ප්‍රතිසංවිධානය කිරීමට ත් උපදේශකවරයෙකු ගේ සේවය ලබා ගැනීමට ත් මූලික පියවර ගන්නා ලදී. |

## දුම්රිය ආරක්ෂක හමුදා වාර්ෂික මෙහෙවර

| අංකය | විස්තරය | 2007 |
|---|---|---|
| 01 | දු.ආ.හ. යටතේ අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව | 1,887 |
| 02 | දු.ආ.හ. යටතේ අයකළ අධිගාස්තු හා දඩ මුදල | රු.1,002,988.00 |
| 03 | දු.ආ.හ. යටතේ නඩු පැවරීම් සංඛ්‍යාව | 112 |
| 04 | දු.ආ.හ. යටතේ උසාවි දඩ මුදල් | රු. 83,270.00 |
| 05 | දණ්ඩ නීති සංග්‍රහය යටතේ අත්අඩංගුවට ගැනීම් | 178 |
| 06 | දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවි දඩ මුදල් | රු. 65,600.00 |
| 07 | වාර්තා වී ඇති අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව | 383 |
| | i. ඉවත් කරන ලද අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව | 307 |
| | ii. නීතිමය පියවර සඳහා ප්‍ර.ඉ.(මා/ක) වෙත යොමුකිරීම් | 229 |
| 08 | විවිධ කරුණු යටතේ විවෘත කරන ලද ලිපිගොනු | 1,268 |
| 09 | නිම කරන ලද ලිපිගොනු සංඛ්‍යාව | 492 |
| 10 | අලාභ අය කර ගැනීම් සහ හිඟ බදු අය කර ගැනීම් | රු. 1,011,203.00 |

## 2007 වසරේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ දී මුහුණ දීමට සිදුවූ ගැටළු.

1 තීරණ ගැනීමේ දී කළමනාකාරිත්වයට ඇති සීමා.
(මගී ගාස්තු සැපයුම් තීරණ, විනය හා කාර්ය මණ්ඩල ඇබෑර්තු පැවතීම)
2 වත්කම් නඩත්තුව සඳහා නියමිත ප්‍රතිදාන නොලැබීම.
3 දුම්රිය රක්ෂිතවල අනවසර පදිංචිය.
4 විශේෂඥ දැනුම හිඟකම.
5 දෙපාර්තමේන්තු වත්කම් පිරිහීම.

වර්තමානයේ මෙම ගැටළු මුල් කර ගෙන ආදායම් ඉක්මවා වියදම් ව්‍යුහයේ ඉහළ යාමක් හේතු කොට ගෙන මෙම වර්ෂයේ 4,200 ඉක්මවූ ආලාභයක් දැකිය හැක. මෙරට ආර්ථික සංවර්ධනය කඩිනම් කළයුතු වකවානුවක දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් විශාල පිරිවැයක් භාණ්ඩාගාරයට දැරීමට සිදු වේ. මූල්‍යමය වශයෙන් රජයට සිදුවන බර ක්‍රමානුකූලව ලිහිල් කිරීමට එනම් විචල්‍ය පිරිවැය සපුරා ගැනීමට ප්‍රමාණවත් හා දෙවනුව ස්ථාවර පිරිවැය ඇතුළු පුනරාවර්තන වියදම් අවම කර ගැනීමට හැකි ආදායම් ඉලක්ක කොට සැලසුම් සම්පාදනය කඩිනම් කළ යුතුය.

## ඉදිරි සංවර්ධනය සඳහා කෙටිකාලීන අරමුණු සහ වැඩසටහන්

2008 වසර ශ්‍රී ලංකා දුම්රිය සේවය ඵලදායි පදනමක් මත කාර්යශීලි පොදු ප්‍රවාහන සැපයුම් කරුවකුගේ මට්ටමට ගෙන යෑමේ දිගු ගමනක පදනම දැමීම 2007 වැඩසටහන මගින් සිදුකිරීමට උත්සාහ ගන්නා ලදි.

දශක ගණනාවක් තළ දිගින් දිගටම දුම්රිය සඳහා කරන ලද ආයෝජන තුළින් අපේක්ෂිත ඵලදායිතාවය නොලැබීම නිසා නොකඩවා සිදුවූ වත්කම්වල පිරිහීම, මානව සම්පත් බිඳ වැටීම වලක්වා ගැනීමට සුදුසු පියවර ගැනීම සඳහා තෝරා ගත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාවට නැන්වීමේ අභිප්‍රායෙන් කටයුතු කරන ලදි.

- දුම්රිය ස්ථානවල හා මැදිරිවල පිරිසිදුකම හා ගුණාත්මකභාවය තහවුරු කිරීම.
- දුම්රිය ප්‍රමාදයන් 25% කින් හා දුම්රිය පීලි පැනීම් වැනි අනතුරු 50% කින් පහත හෙළීම.
- දුම්රිය පද්ධතියේ පැ.කි. 8 ට අඩු වේග සීමා සියල්ල ඉවත් කිරීම.
- දුම්රිය සේවයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව ස්ථාපනය කිරීම.
- මගී මැදිරි 100 ක් ආනයනය කිරීම/ බලවේග කට්ටල 15 ක් මිලදී ගැනීම/තෙල් ටැංකි 20 ක් මිල දී ගැනීම.
- දුම්රිය මාර්ග සංවර්ධනය යටතේ පුත්තලම මාර්ගය (ජා ඇල/සීදුව) ද්විත්ව මාර්ගයක් ලෙස ඉදි කිරීම/ මුහුදු බඩ මාර්ගය (වාද්දුව/ අළුත්ගම) ද්විත්ව මාර්ගයක් බවට පත්කිරීම/ උතුරු දිග මාර්ගය (පොල්ගහවෙල/ අනුරාධපුරය) සංවර්ධනය.
- සේවක මණ්ඩල පිහිටුවා ක්‍රියාත්මක කිරීම.
- කාර්ය සාධන සහ ඇගයීම් ඒකක පිහිටුවා ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය ප්‍රතිධානයන් ක්‍රමවත්ව හා සේවාවන්ට අනුරූපව ලබා ගැනීමේ ක්‍රම වේදයක් ස්ථාපනය කිරීම.
- දුම්රිය සේවයේ පවත්නා ඍණ දායකත්වය ධන දායකත්වයක් බවට පත් කිරීම.